# කටුවන ප්‍රාදේශීය සභාව
# හම්බන්තොට දිස්ත්‍රික්කය

----------------------------

1 **මූල්‍ය ප්‍රකාශන**

----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 29 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 26 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

----------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට කටුවන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

--------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

පහත විස්තර දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2016 නොවැම්බර් 17 දින සභාවට භාරදී තිබූ රු. 6,313,558 ක් වූ ආදාහනාගාර ගොඩනැගිල්ලේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු. 6,250,100 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ගිවිසුම්ගතව තිබුණු රු. 432,336 ක් වූ කර්මාන්තයක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන ඇති කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේ නිර්දේශ පරිදි සමාලෝචිත වර්ෂය තුළ ඉවත්කර තිබූ රු. 208,308 ක් වූ වත්කම් වල පිරිවැය ගිණුම් වලින් ඉවත් කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන හා පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ රු. 107,000 ක් වූ වත්කම් 06 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ රැඳවුම් මුදල් රු. 90,497 ක් ගිණුම්ගත කර නොතිබූ අතර ලිපි ද්‍රව්‍ය හා ඉන්ධන තොගයේ වටිනාකම රු. 53,570 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(උ) සාමාන්‍ය තොග යටතේ ගිණුම්ගත කළ යුතු රු.61,882 ක් වූ තොග අගය, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම් ගත කර තිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**

**--------------------------**

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් 02 ක ශේෂයන් සහ ඊට අදාළ පොත්පත් හා උපලේඛන වල දැක්වෙන ශේෂයන් අතර, එකතුව රු.46,367,385 ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**----------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ලැබිය යුතු ගිණුම්

------------------

i. වර්ෂ ගණනාවක සිට අයවිය යුතුව පවතින රු.76,717 ක දේපළ ණය පොලී සමාලෝචිත වර්ෂය තුළදීද අයවී නොතිබුණි.

ii. 2006 වර්ෂයේ සිට ගිණුම්වල ඉදිරියට ගෙනෙමින් පවතින හා 2016 දෙසැම්බර් 31 දිනට රු. 521,529 දක්වා වර්ධනය වී තිබුණු, ලැබිය යුතු වීපී පහන් ප්‍රතිපූර්ණ මුදල අයකර ගෙන නොතිබුණි.

iii. 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කර්මාන්ත 20 ක් වෙනුවෙන් රු. 16,407,810 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

--------------------

i. 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ඉටු කරන ලද කර්මාන්ත 20 ක් සඳහා රු.16,457,810 ක මුදලක් ගෙවිය යුතුව තිබුණි.

ii. 2016 දෙසැම්බර් 31 දිනට සභාවේ බේරුම් නොකළ බැරකම් වල මුළු වටිනාකම රු.22,271,895 ක් වූ අතර, ඉන් රු.11,593,846 ක් වූ බැරකම් ඉකුත් වර්ෂයට අදාළ ඒවා විය.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

**------------------------------------**

එකතුව රු. 152,702 ක් වූ 2011 හා 2012 වර්ෂ වලට අදාල හිඟ මුද්දර ගාස්තු වලට අදාළ ලේඛන සහ උපලේඛනද, එකතුව රු. 5,118,836 ක් වූ හිඟ ජල ගාස්තු ආදායමට අදාල උපලේඛනයද, පිළිවෙලින් එකතුව රු. 110,150 ක් හා රු. 1,421,468 ක් වූ හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු හා හිඟ කඩ කාමර කුලී ආදායම්වලට අදාල යාවත්කාලීන කළ ලේඛනද ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 1.3.5 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| i. 152(2) වගන්තිය | සභා ප්‍රදේශය තුළ පරිවයේ යෙදෙන වෘත්තිකයන් ගෙන් බදු අයකර ගෙන නොතිබුණි. |
| ii. 154 වගන්තිය | සභා සීමාවේ ඉඩම් විකිණීම මත ලද මුදලින් සියයට 1 ක බදු අය කරනු වෙනුවට එම ඉඩම්වල තක්සේරු වටිනාකම මත බදු අයකර තිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | |
| i. රීති 177 | සභාව සතු සති පොළවල් 08 ක් ටෙන්ඩර් කර බදු දීමට කටයුතු කර නොතිබුණි. |
| ii. රීති 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව වාර්ෂික සමීක්ෂණ සිදුකර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| i. මුදල් රෙගුලාසි 571 | වර්ෂ දෙකක කාලයක් ඉක්මවන ලද එකතුව රු. 874,285 ක් වූ කර්මාන්ත රැඳවුම් ශේෂ 41 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| ii. මුදල් රෙගුලාසි 1645(අ) | වාහන වල ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (ඈ) 2015 ඔක්තෝබර් 09 දිනැති හා අංක PDF/RED/2015/ පොදු (i) දරන මුදල් අධ්‍යක්ෂවරයාගේ ලිපියේ 4.3 (අ), (ආ) සහ (ඉ) වගන්ති | ස්ථාන මාරුවී ගිය, මියගිය, විශ්‍රාම ගිය, සේවය හැරගිය හා සේවයෙන් පහකළ නිලධාරීන් 09 දෙනෙකුගේ රු. 26,525 ක ණය ශේෂ අයකර ගෙන නොතිබුණි. |

## 1.3.6 අධිකාරි බලය නොලත් ගනුදෙනු

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභා කමිටු තීරණයකින් තොරව මීද්දෙනිය පොළ පිවිසුම් මාර්ගය සැකසීමේ කර්මාන්තය සඳහා රු. 50,989 ක මුදල් වැයකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවස්ථා දෙකකදී එකතුව රු. 198,710 ක් වන විදුලි භාණ්ඩ තොග ගබඩාවට සපයා තිබුණු අතර, එම භාණ්ඩ සැපයීම සම්බන්ධයෙන් මිල ගණන් කැඳවීම්, ඇණවුම් කිරීම් සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර, මෙම සැපයුම් සම්බන්ධයෙන් 2017 ජූලි 31 දින වන විටත් ගෙවීම් සිදුකර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 11,702,240 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 4,556,232 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 7,146,008 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන ආදායමින් සියයට 86 ක් තරම් ඉහළ අගයක පුනරාවර්තන වියදම් පැවති අතර, එය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් නොවන බව නිරීක්ෂණ විය.

(ආ) සෑම වර්ෂයකම ස්වයං උත්පාදන ආදායම් ඉක්මවා සැලකිය යුතු අගයන්ගෙන් පුනරාවර්තන වියදම් දරා ඇති බවත්, ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ආදායම් වලින් කිසිදු ආකාරයකින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇති බවත් වියදම් පාලනය කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමුවී නොමැති බවත් පෙන්නුම් කෙරුණි.

## 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ ණයගැති ශේෂය තුළ වර්ෂ 3 කට වැඩි කාලයක් තිස්සේ අය නොවී පවතින රු. 16,407,810 ක ණයගැති ශේෂ පැවතීමෙන් ජංගම හා ක්ෂණික අනුපාතයන් ප්‍රකාර ද්‍රවශීලතා තත්ත්වයන් නොපවතින බව නිරීක්ෂණය විය.

**2.4 ආදායම් පරිපාලනය**

---

**2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

---

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය පිළිබඳ පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා බිල් කළ ආදායම රු. 40,407,161 ක් වූ අතර, ඉන් රු. 29,535,393 ක් රැස්කර තිබුණි. ඒ අනුව ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 73 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට ලැබිය යුතු ආදායම් ශේෂවල එකතුව රු. 12,668,669 ක් වූ අතර ඉන් රු. 8,745,995 ක් අයවී තිබුණි. ඒ අනුව හිඟ ආදායම් අයකිරීමේ ප්‍රගතිය සියයට 69 ක් විය.

**2.4.2 වරිපනම් බදු**

---

2004 ජුනි 23 දිනැති අංක 1346/9 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් දියුණු ගම් ප්‍රදේශ ප්‍රකාශයට පත්කර තිබුණද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තියට අනුව වරිපනම් බදු ප්‍රදේශ තක්සේරු කර වරිපනම් බදු අයකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

**2.4.3 අක්කර බදු**

---

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1)(අ) වගන්තිය ප්‍රකාර හිඟ අක්කර බදු අයකිරීම ප්‍රමාණවත් මට්ටමක නොතිබුණි. ආරම්භක හිඟයෙන් සමාලෝචිත වර්ෂය තුළ සියයට 7 ක අගයක් අයකර ගෙන තිබුණි.

**2.4.4 බදු කුලී**

---

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කඩ කාමර 21 කින් රු. 394,347 ක කුලී අයකර ගෙන නොතිබුණි.

(ආ) 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 04 වන ඡේදයට අනුකූලව 2015 වර්ෂයේදී ගිවිසුම්ගතවූ කඩ කාමර දෙකකින් රු. 425,000 ක එක්වන් මුදල් අයකර ගෙන නොතිබුණි.

**2.4.5 කර්මාන්ත බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු**

---

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර ඒකක 25 කින් රු.25,850 ක ගාස්තු අයකර ගෙන නොතිබුණි.

**2.4.6 වෙනත් ආදායම්**

**-----------------**

**(අ) යන්ත්‍රෝපකරණ ආදායම්**

**---------------------------**

2013, 2014, 2015 හා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවිය යුතු යන්ත්‍රෝපකරණ ආදායම රු.923,557 ක් විය.

**(ආ) ජල ගාස්තු ආදායම**

**--------------------**

2016 දෙසැම්බර් 31 දිනට හිඟ ජල ගාස්තු ආදායම රු.5,118,836 ක් විය.

**2.4.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**----------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.800,372 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු. 6,213,800 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**--------------------------**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**------------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) විවිධ රාජ්‍ය ආයතන මගින් සභාවට ලබාදී තිබුණු වාහන 05 ක හා රු. 860,750 ක් වූ ඉඩම් 12 ක අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි.

(ආ) මිද්දෙනිය සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 06 ක් දීර්ඝකාලීන බදු පදනම මත බදු දීම සඳහා 2016 අගෝස්තු 01 ටෙන්ඩර් කැඳවා තිබූ අතර, එහිදී තෝරාගත් බදුකරු සමඟ 2017 ජූලි 31 දින දක්වාම ගිවිසුම්ගත වීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මිද්දෙනිය නව සතිපොළෙහි කඩ කාමර 10 න් 09 ක් ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව එක් කඩ කාමරයකට රු. 50,000 බැගින් එකතුව රු. 450,000 ක එක්වන් මුදල් ලබාගෙන පුද්ගලයින් 09 දෙනෙකු වෙත ලබාදී තිබුණද, වර්ෂයකට වඩා වැඩි කාලයක් එම කඩ කාමර වලින් කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

**---------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් කසල බැහැර කරන භූමිය හා කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා, ජාතික පරිසර පනතෙහි 2000 අංක 53 දරන නව ගැසට් සංශෝධනයට අනුව නිකුත් කළ 2008 ජනවාරි 25 දිනැති හා අංක 1553/16 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුකූලව පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගැනීමට 2017 ජූලි 31 දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) කොම්පෝස්ට් අංගනය සඳහා ස්ථිරව සේවකයින් අනුයුක්ත කර නොතිබුණ අතර, ආදේශක සේවකයින් දෙදෙනෙකු වරින් වර සේවයේ යොදවා තිබූ බැවින් ව්‍යාපෘතියේ කටයුතු අඛණ්ඩව සිදුව නොතිබුණි.

(ඇ) 2016 මැයි 07 දින කොම්පෝස්ට් අංගනයේ නිෂ්පාදන කටයුතු ආරම්භ කර තිබුණු අතර, හලර් යන්ත්‍රයක් සභාව සතුව නොමැතිවීම නිසා එදින සිට 2017 ජූලි 31 දින දක්වා නිෂ්පාදනය කළ කොම්පොස්ට්, අංගනයේ කොටසක ගොඩගසා තිබුණි.

**3.3 නිෂ්ක්‍රිය වත්කම්**

-----------------

කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය වර්ෂය පුරාමද, සභාවේ වාහන 06 ක් වර්ෂ ගණනාවක සිටද නිෂ්ක්‍රීයව පැවතුණි.

**3.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අතිරික්ත කාර්ය මණ්ඩලය 9 ක් වූ අතර, පුරප්පාඩු සංඛ්‍යාව 09 ක් විය. පුරප්පාඩු පුරවා ගැනීමට හෝ අතිරික්ත සංඛ්‍යාව විධිමත් කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) සේවකයින් 16 දෙනෙකුට ඔවුන්ගේ නියමිත තනතුරුවලට අදාළ රාජකාරීවල සේවයේ නොයොදවා වෙනත් රාජකාරී පවරා තිබුණි

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

--------------------------------------

**4.1 අයවැය පාලනය**

------------------

වැය විෂයයන් 28 ක් සඳහා අයවැය ලේඛනය මඟින් සලසා තිබූ එකතුව රු. 1,192,000 ක් වූ සම්පූර්ණ මුදලද, වියදම් විෂයයන් 72 ක රු. 11,733,194 ක් වූ ඉතිරිවීම්ද නිරීක්ෂණය වූ අතර, එහි අගයන් සියයට 10 සිට සියයට 98 දක්වා පරාසයක පැවතුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5.2 නොවිසඳී ඇති විගණන ජේද**

-----------------------------

සභාව සතු ඉඩම් 04 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

--------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) අයවැය පාලනය